විල්ගමුව ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය
------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මැයි 03 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 27 දින ද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 27 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.3 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට විල්ගමුව ප්‍රදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
--------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ප්‍රාග්ධන යෙදුමින් ආදායමට දායකවීමේ ගිණුමේ ශේෂය හා ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂය අතර රු.1,471,340 ක වෙනසක් තිබුණි. | වෙනස සොයාබලා නිවැරදි කළ යුතු වේ. | වෙනසට හේතු සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මුළු වත්කම් සහ මුළු හිමිකම් සහ වගකීම් අතර රු.1,332,696 ක වෙනසක් තිබුණි. | වෙනස නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ ඉටුකරන ලද කර්මාන්ත 25 කට අදාළ රු.3,173,963 ක් ණයහිමි ගිණුම්වලින් අත්හැරී තිබුණි. | ණයහිමි ශේෂ නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේදී හෙට්ටිපොල පුස්තකාලයට පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.53,670 ක පොත් ගිණුම්වලින් අත්හැරී තිබුණි. | පරිත්‍යාග ගිණුම්ගත කර නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| (v) | පුර නැගුම ව්‍යාපෘතියෙන් ලැබී තිබුණු ජල නල උපාංග තක්සේරු කර සමාලෝචිත වර්ෂයේ අවසාන තොගයට ගෙන නොතිබුණි. | තොග තක්සේරු කර නිවැරදි කළ යුතු වේ. | මෙම ද්‍රව්‍ය පරිත්‍යාගයන් වටිනාකම් රහිතව ලබා දී තිබීම නිසා තක්සේරු කළ නොහැකි වීම හේතුවෙන් අවසන් තොග වශයෙන් ගණනය නොකළ බව දන්වමි. |
| (vi) | සමාලෝචිත වර්ෂය අවසානයට සභාව සතු ලිපිද්‍රව්‍ය ඇතුළු ගබඩා තොගය ගණනය කර ගිණුම් ගත කර නොතිබුණි. | ලිපිද්‍රව්‍ය තොගය ගණනය කර තොගය නිවැරදි කළ යුතු වේ. | ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කිරීම තුළින් 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරන බව දන්වමි. |
| (vii) | සමාලෝචිත වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් දක්වා වූ කාලයට අදාළව මුද්දර ගාස්තු ආදායම රු.424,100 ක් ගිණුම්ගත කර නොතිබුණි. | මුද්දර ගාස්තු නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (viii) | සමාලෝචිත වර්ෂයේ ලබාගෙන තිබුණු අත්තිකාරම් ශේෂ 04 ක වටිනාකම වූ රු.48,000 ක් පියවා නොතිබීම නිසා වර්ෂයේ වියදම අඩුවෙන් දැක්වේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අත්තිකාරම් පියවා වියදම් නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |

(ආ) නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.12,795,223 ක් වූ ගිණුම් විෂයන් 13 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර රු.3,153,574 ක වෙනසක් පැවතුණි. | වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කළ යුතු වේ. | වෙනස්කම් සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.1,501,545 ක් වූ නමුත් මේ පිළිබඳව සොයාබලා ගිණුම්වල අවශ්‍ය ගැළපීම් කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම්වල අවශ්‍ය ගැළපීම් කර අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතු වේ. | ජනල් සටහන් අංක 03,06,07 යටතේ අවිනිශ්චිත ගිණුමට ගැළපීම් කර ඇත. |

(ඇ) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වසර ගණනාවක සිට දිගින් දිගටම පැවත එන ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක එකතු වටිනාකම රු.910,704 ක් අයකර ගෙන නොතිබුණි. | ලැබිය යුතු මුදල අයකර ගත යුතු වේ. | හිඟ කුලී රු.241,238 ක් කපාහැරීම සඳහා ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතියට ඉදිරිපත් කර ඇති අතර අනෙකුත් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරමි. |

(ඉ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.74,642,244 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | විල්ගමුව ප්‍රාදේශීය සභාව විසින් භුක්තිවිඳින ඉඩම් කොටස් සභාවට පවරා නොදීම හේතුවෙන් පී.එස් 46 ප්‍රකාරව ලේඛනයක් පිළියෙල කර ඇතත් එම ලේඛනයේ පැවරුම් නියෝග හෝ ඔප්පු අංක සඳහන් කිරීමට නොහැකි බවත් අනෙකුත් ගිණුම් විෂයන් සඳහා නිවැරදි උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

1.3 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය | සභා මාර්ග ගැසට් කර නොතිබුණි. | සභාව සතු මාර්ග ගැසට් කළ යුතු වේ. | ප්‍රදේශයේ සියලු මාර්ග විධිමත් ක්‍රමවේදයක් යටතේ හඳුනාගෙන ගැසට් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | රීති අංක 217 | සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා සියලුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව පී.එස් 46 ආකෘතිය | ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් පී.එස්.46 ආකෘති පවත්වා ගත යුතු | පී.එස්. 46 ආකෘති ප්‍රකාරව ලේඛනයක් පිළියෙල කර ඇතත් සභාවට පැවරීම් නොකිරීම හේතුවෙන් පැවරුම් නියෝග හෝ ඔප්පු |

| | | |
|---|---|---|
| ප්‍රකාරව ලේඛනයක් පවත්වා ගෙන නොතිබුණි. | වේ. | අංක සඳහන් කිරීමට නොහැකි වී ඇත. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ අදායම රු.7,012,600 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,323,774 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
---------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,102,907 | 2,838,694 | 2,671,857 | 1,341,007 | 6,575,000 | 2,963,288 | 2,508,972 | 1,174,701 |
| කුලි | 1,800,000 | 1,929,720 | 1,929,720 | 900,069 | 1,780,000 | 1,764,868 | 1,764,864 | 900,069 |
| බලපත්‍ර ගාස්තු | 1,715,000 | 1,252,183 | 1,252,133 | 1,980 | 1,665,000 | 1,384,138 | 1,384,138 | 1,985 |
| වෙනත් ආදායම් | 2,291,200 | 1,709,188 | 1,762,188 | - | 1,636,000 | 1,889,789 | 1,889,789 | - |
| එකතුව | 9,909,107 | 7,729,785 | 7,615,898 | 2,243,056 | 11,656,000 | 8,002,083 | 7,547,763 | 2,076,755 |

2.2.2 වරිපනම්
----------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.269,786 ක් වූ හිඟ වරිපනම් ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. |

2.2.3 කුලී
-----

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එනුලබන රු.900,069 ක් වූ හිඟ හිටි කඩකුලී අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතු වේ. | හිඟ කුලී කපාහැරීමට මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතියට යවා ඇති බව දන්වමි. |

2.2.4 ජල ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂය අවසාන වන විට අයවිය යුතුව පැවති හිඟ ජල ගාස්තු රු.1,071,222 ක් අයකර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

2.2.5 ප්‍රචාරණ දැන්වීම් පුවරු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| විල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථාන 27 ක සවිකර තිබූ ප්‍රචාරණ පුවරුවලට අදාළව රු.93,100 ක ගාස්තු අයකර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර ඒ අනුව කටයුතු කළ යුතු වේ. | අඩුපාඩු අවම කර ගනිමින් 2019 ක්‍රියාකාරී සැලැස්ම සකස්කර ගැනීමට කටයුතු කරමි. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් රු.3,261.483 ක වියදමක් දරා තිබුණ ද කසළ නිසි කළමණාකාරිත්වයකින් තොරව | ඝන අපද්‍රව්‍ය සුදුසු පරිදි බැහැර කළ යුතු වේ. | ප්‍රාදේශීය සභාව වෙත ඉඩම් අයිතිය නොමැති වීම හේතුවෙන් මෙම තත්ත්වය ඇතිවී ඇත. |

රජයේ රක්ෂිත ඉඩමකට දිනපතා බැහැර කර තිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟාවීමට සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පිළිතුර අනුව කටයුතු කිරීම කළ යුතු වේ. | ඉදිරියේදී තිරසාර වූ කසළ කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කරමි. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සේවක පුරප්පාඩු | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභාවේ තනතුරු 10 ක පුරප්පාඩු 23 ක් පැවතුණි. | සේවක පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා, පළාත් පාලන කොමසාරිස්තුමා, ගරු ආණ්ඩුකාරතුමා හා මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්තුමිය දැනුවත් කර ඇත. |
| (ආ) සේවක ණය | | |
| හිටපු නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු.88,823 ක සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක ණය අයකර ගත යුතු වේ. | මෙම නිලධාරින්ගේ ණය ලිපිගොනු අස්ථානගත වීම නිසා ඇපකරුවන් හඳුනාගත නොහැකි වී ඇත. |

3.3 වත්කම් කළමනාකරණය

3.3.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විවිධ ආයතනවලින් ප්‍රාදේශීය සභාව වෙත ලබාදී ඇති වාහන 05 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා නොගත් වාහන පවරා ගත යුතු වේ. | මෙම වාහන සුදුසු පරිදි පවරා ගැනීමට හා වෙන්දේසි කිරීමට කටයුතු කරමි. |

3.3.2 නිෂ්ක්‍රිය/ ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාහන 06 ක් දීර්ඝ කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි. | ප්‍රයෝජනයට නොගන්නා වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ සුදුසු පරිදි අපහරණය කළ යුතු වේ. | 2018 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය මඟින් වෙන්දේසි කිරීමට නිර්දේශ කර ඇති බව දන්වමි. |
| (ආ) | 2006 වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලද විදුලි ජනන යන්ත්‍රයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන තිබුණි. | යන්ත්‍රය නිෂ්කාර්යව තබා නොගෙන ප්‍රයෝජනයට ගැනීම සඳහා කටයුතු කළ යුතු වේ. | අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

3.4 ආර්ථික නොවූ ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | හෙට්ටිපොල ළමා උද්‍යානය සංවර්ධනය කිරීම සඳහා 2015 වර්ෂයේදී රු.1,650,000 ක් වැයකර තිබුණ ද ළමා උද්‍යානය වල් බිහිවී කැළෑවෙන් වැසී තිබුණු බැවින් අපේක්ෂිත ප්‍රතිලාභ ලැබී නොතිබුණි. | වත්කම් සුදුසු පරිදි භාවිතයට ගත යුතු වේ. | මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයා විසින් මෙම සභාව වෙත යොමු කර ඇති රු.ලක්ෂ 30 ක මුදලින් ඉදිරියේ දී මෙම ළමා උද්‍යානය ආකර්ශණීය ලෙස සකස් කර ක්‍රීඩා කිරීමට සුදුසු තත්ත්වයට පත්කිරීමට අපේක්ෂා කරමි. |
| (ආ) | 2014 වර්ෂයේ නිමකර තිබුණ ද ආදාහනාගාරය සඳහා සුදුසු ප්‍රවේශ මාර්ගයක් සකස් කිරීමට නොහැකි වීම නිසා වැය කළ රු.මිලියන 10 ක මුදලින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. | මාර්ග පහසුකම් සකස් කරගෙන ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | පළාත් සභා ප්‍රතිපාදන යටතේ අනුමත වී ඇති රු.ලක්ෂ 21 ක මුදලින් මිනිපේ ඇල හරහා පාලමක් ඉදිකර ඉන් පසුව පිවිසුම් මාර්ගයක් සකස් කර සභා අරමුදලින් හෝ වෙනත් ආධාර මඟින් මෙම ආදාහනාගාරය ආකර්ශනීය ලෙස සකස් කිරීමට අපේක්ෂා කිරීමට කටයුතු කරමි. |

3.5 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලට අනුව පුස්තකාල 04 ක රු.40,891 ක් වටිනා පොත් 407 ක ඌනතාවය සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කිරීම. | මෙම මුදල අයකර ගැනීම සඳහා ඉදිරි කටයුතු කරමි. |